සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

Learning Resource Center
Dr. Marcus Fernando College
Kandana
51065
2025-01

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
**Year End Evaluation - 2024 (2025)**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂයය / பாடம் / Subject | පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි |

නම / பெயர் / Name ........................................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

සැලකිය යුතුයි.

- I කොටසේ ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.
- II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා I කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

1. රටේ නීතිය හා සාමය සුරකිමින් සමාජ ...................................... තහවුරු කිරීම පොලිසියේ ප්‍රධාන වගකීමකි.
2. රැකියාව තුළ ....................................පත්වීමට නම් රැකියා ලාභියාතුළ වර්ධනය කරගත යුතු කුසලතා රාශියකි.
3. ගැටුමක් හෝ මතභේදයක් විසඳා ගැනීම සඳහා යොදාගන්නා ක්‍රමවේදයක් ලෙස ...............................වැදගත් වේ.
4. මාතලේ, මහනුවර හා නුවර එළිය දිස්ත්‍රික්ක ........................................පළාතට අයත් වේ.
5. ආදර්ශමත් ගතිපැවතුම් ප්‍රගුණ කිරීම ස්ථිරසාරභාවය ඇතිකර ගැනීමට ............................... කරගත යුතු ගුණාංගයක් වේ.

(ආරක්ෂාව, සමථකරණය, සුරක්ෂිතතාව, සාර්ථකත්වයට, මධ්‍යම, වර්ධනය, ඌව, මර්ධනය)

- "අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.

6. තාක්ෂණික වෙනස්වීම් නිසා ඇතිවන අහිතකර බලපෑමක් වන්නේ,
   (1) වැඩ පහසු වීම ය. (2) මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම ය.
   (3) කාර්යක්ෂමතාව වැඩිවීම ය. (4) කාලය ඉතිරිවීම ය.
7. ශ්‍රී ලාංකික ජනතාවට සර්වජන ඡන්ද බලය හිමිවූයේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය තුළින්ද?
   (1) කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය.
   (2) සොල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය.
   (3) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය.
   (4) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය.
8. මහ නගර සභාවක ප්‍රධානියා ලෙස කටයුතු කරන්නේ,
   (1) නගරාධිපති ය. (2) සභාපති ය. (3) ලේකම් ය. (4) නාගරික කොමසාරිස් ය.

9. ඉරාකය හා කුවේටය අතර ඛනිජ තෙල් සඳහා පවතින ගැටුම,
   (1) දේශපාලන මූලමත ඇති වූ ගැටළුවකි.
   (2) සමාජ මූලමත ඇති වූ ගැටළුවකි.
   (3) දේශසීමා මූලමත ඇති වූ ගැටළුවකි.
   (4) ආර්ථික මූලමත ඇති වූ ගැටළුවකි.

10. "සුරකිමු ලකඹර" යන ආදර්ශ පාඨය ශ්‍රී ලංකාවේ කුමන හමුදාවක ආදර්ශ පාඨය ද?
   (1) ශ්‍රී ලංකා පොලීසිය.
   (2) ශ්‍රී ලංකා ගුවන් හමුදාව.
   (3) ශ්‍රී ලංකා නාවික හමුදාව.
   (4) ශ්‍රී ලංකා යුධ හමුදාව.

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති වගන්ති හරිනම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

11. ළමා හිංසනය හා අපචාර පිළිබඳව දැනුම්වත් කිරීමේ සෘජු දුරකථන අංකය 1929 වේ ( )
12. නීතිගරුක බව, පරිත්‍යාගශීලී බව, යහජීවන ගුණාංග වලට උදාහරණ වේ. ( )
13. ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ ක්‍රියාත්මක වූයේ වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයයි. ( )
14. ගැටුම් නිරාකරණය සඳහා යොදාගත හැකි සරලම ක්‍රමය සාකච්ඡා ක්‍රමයයි. ( )
15. රොබට් ඕස්ටින් මහතා සමුපකාර ව්‍යාපාරයේ පියා ලෙස සැලකේ ( )

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා (අ) හා (ආ) තීරු නිවැරදිව ගලපා හිස්තැනමත ඉංග්‍රීසි අක්ෂරය ලියන්න.

| (අ) තීරුව | | (ආ) තීරුව |
|---|---|---|
| 16. ශ්‍රී ලංකාවේ මුලින්ම ආරම්භ කළ මහ නගර සභාවකට උදාහරණයකි, | ( ) | A අපරාධ නීතියට ය. |
| 17. රැකියාවක් සඳහා අයදුම් කිරීමේදී තොරතුරු ඇතුලත්කර සකස්කරන පත්‍රිකාව | ( ) | B යෝග්‍යතාසක්ෂණ ය යි |
| 18. මංකොල්ල කෑම්, ස්ත්‍රී දූෂණ වැනි අපරාධ අයත් වන්නේ | ( ) | C කොළඹ. |
| 19. රටක සමාජ, ආර්ථික, සංස්කෘතික, රටාවට ගැළපෙන පරිදි තාක්ෂණය යොදාගැනීම. | ( ) | D සිවිල් නීතියට ය. |
| 20. ඇටඹ, වල්දෙල්, මහරත්මල් ආදී ශාක විශේෂ | ( ) | E ජීව දත්ත පත්‍රිකාව. |
| | | F ඒක දේශික ශාක වේ. |

(ල 2x20 = ල 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- අනිකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

1. (i) සමාජ සුරක්ෂිතතාවයට දායකවන ආයතන දෙකක් සඳහන් කරන්න. (ල. 2යි)
 (ii) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන අධිකරණ ආයතන දෙකක් නම් කරන්න. (ල. 2යි)
 (iii) ආර්ථිකයක සිදුවන ක්‍රියාවලි දෙකක් ලියා දක්වන්න. (ල. 2යි)
 (iv) සහජීවන ගුණාංග දෙකක් සඳහන් කරන්න. (ල. 2යි)
 (v) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල් දෙකක් නම් කරන්න (ල. 2යි)
 (vi) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන මැතිවරණ දෙකක් සඳහන් කරන්න. (ල. 2යි)
 (vii) නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ පළාත් පාලන ආයතන දෙකක් ලියා දක්වන්න. (ල. 2යි)
 (viii) සමථකරණය සඳහා යොදාගත හැකි ගැටුම් වර්ග දෙකක් නම් කරන්න. (ල. 2යි)

(ල. 2x8 = ල 16යි)

2. (i) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව බෙදා ඇති කොටස් දෙක සඳහන් කරන්න (ල. 2යි)
 (ii) සමාජ සුරක්ෂිතතාවය සඳහා නීති සැකසීමේ දී පදනම් කරගෙන ඇති නීති මූලාශ්‍ර හතරක් නම් කරන්න (ල. 4යි)
 (iii) සමාජ සුරක්ෂිතතාව සඳහා පවුලකින් ඉටුවිය යුතු කාර්යයන් පහක් ලියා දක්වන්න. (ල. 5යි)

3. (i) ආර්ථිකයක සිදුවන තාක්ෂණික වෙනස්වීම් සිදුවන අංශ තුනෙන් දෙකක් නම් කරන්න (ල. 2යි)
 (ii) සමූපකාර සමිති වර්ග හතරක් සඳහන් කරන්න. (ල. 4යි)
 (iii) අධ්‍යාපනය සඳහා තාක්ෂණය යොදා ගත හැකි අවස්ථා තුනක් සඳහන්කර, ඉන් එක අවස්ථාවක් අධ්‍යාපනයේ දියුණුවට බලපා ඇති ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5යි)

4. (i) ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ස්වරූප දෙක නම් කරන්න. (ල. 2යි)
 (ii) ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ක්‍රමයක පුද්ගලයකු සතු අයිතිවාසිකම් හතරක් සඳහන් කරන්න. (ල. 4යි)
 (iii) මැතිවරණයකදී පුරවැසියකු ඉටුකළයුතු යුතුකම් පහක් ලියා දක්වන්න. (ල. 5යි)

5. (i) පළාත් පාලන ආයතනයකට මුදල් උපයා ගන්නා ආකාර දෙකක් ලියා දක්වන්න. (ල. 2යි)
 (ii) පළාත් පාලන ආයතනයක් සිදුකරනු ලබන සේවාවන් හතරක් සඳහන් කරන්න. (ල. 4යි)
 (iii) පළාත් පාලන ආයතනවල සේවා ලබාගන්නා මහජනතාව විසින් ඉටුකළ යුතු යුතුකම් තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5යි)

6. (i) ගැටුම් ඇතිවීමට බලපාන හේතු දෙකක් නම් කරන්න. (ල. 2යි)

(ii) ගැටුම් ඇතිවන පාර්ශව හතරක් සඳහන් කරන්න. (ල. 4යි)

(iii) ගැටුම් නිරාකරණය සඳහා ප්‍රගුණ කළයුතු ගුණාංග පහක් ලියා දක්වන්න. (ල. 5යි)

7 (i) වැඩ ලෝකයේ පවතින පහත සඳහන් ක්ෂේත්‍ර වලට අදාල රැකියා දෙක බැගින් ලියන්න.

A රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියා

B ස්වයං රැකියා (ල. 2යි)

(ii) වෘත්තීය පුහුණුව ලබාදෙන ආයතන හතරක් සඳහන් කරන්න. (ල. 4යි)

(iii) ජීවදත්ත පත්‍රිකාවක් සැකසීමේදී සැලකිය යුතු කරුණු පහක් නම් කරන්න. (ල. 5යි)